රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 3/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 ජනවාරි මස 21 වැනි දි

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා
II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම.

ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා
II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳව වූ 87.5.28 දිනැති රා.ප.චක්‍රලේඛ 371 සම්බන්ධව කරුණාකර,

(I) I වැනි ජේදයේ (අ) ට පෙර ඇති කොටස ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කරන්න:-

" 1987.3.11 දිනට හෝ ඉන්පසු දිනකට හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අවුරුදු 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවයේ ස්ථිර කරන ලද හා පහත දැක්වෙන සුදුසුකම් සපුරාලන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියකු, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ I ශ්‍රේණියට 1987.3.11 දින සිට හෝ එම සුදුසුකම් සපුරාලන දිනයේ සිට හෝ උසස් කරනු ලැබේ. "

(II) 4 ජේදයේ සඳහන් කර හා යා කොට තිබූ ආදර්ශ ආකෘතියට මෙය එකතු කරන්න:-

" 7. උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමේ දිනයට පූර්වාසන්න වූ 5 අවුරුදු කාලය තුළ සිදු කරන ලද වරදක් සඳහා ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේ ද? "

(III) 7 සහ 8 පිළිවෙලින් 8 සහ 9 යනුවෙන් කියැවෙන පරිදි සංශෝධනය කරන්න.

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය පිළිබඳව වූ 87.10.29 දිනැති රා.ප.චක්‍රලේඛ 384 සම්බන්ධව කරුණාකර,

(I) I (ඉ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරන්න:-

" ඉ. උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමේ දිනයට පූර්වාසන්න අවුරුදු 5 කාලසීමාවක් තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම."

(II) චක්‍රලේඛයේ 4 ඡේදයේ සඳහන් කර හා යා කොට තිබූ ආදර්ශ ආකෘතියේ 7 ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරන්න:-

" උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමේ දිනයට පූර්වයෙන් වූ 5 අවුරුදු කාලය තුළ සිදුකරන ලද වරදක් සඳහා ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේ ද?"

Siriwardhana

( ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන )

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.